# වැදි ජනතාවගේ ගුහා සිත්තම්

අද ජීවත් වන වන්නියෙලැත්තන් ගේ මුතුන් මිත්තන් ගේ උදාර කලා රසාඥතාව හා සහජ හැකියාව පැහැදිලිව දෙස් දෙන වැදි ගුහා සිත්තම් කිහිපයක හමන්ගල ගල්ගුහා වල දක්නට ලැබේ. බොහෝ පර්යේශකයන් ගේ පිළිගැනීම නම් මේවා තමන්ගේ ස්වාමිවරුන් දඩයමේ ගොස් එනතුරු සිරිත් පරිදි ගුහාවේ රැඳී සිටි බිරියන් විසින් අඳින ලද සිත්තම් ලෙස ය.

මේ ගුහා සිත්තම් පිළිබිඹු කරන්නේ වන්නියෙලැත්තන් ගේ ගැහැණු උදවියට පෙනී ගිය අයුරු ඔවුන් ගේ සංස්කෘතියෙහි දීප්තිමත් වික්‍රමයන් ය. මේ වාම් එහෙත් සුලලිත, රූ සටහන් වලින් මූර්තිමත් වන්නේ තමන්ගේ වනාන්තර වාසභූමියෙහි ප්‍රබල ම සතුනටත් වඩා නිර්භීත ක්‍රියාවන්හි යෙදෙන වැදි මිනිසුන් පිළිබඳ සංකල්පනයන් ය.

මේ සිත්තම්වල මිනිස් හිස් වටා ඇඳ තිබෙන රැස් වළල්ල හිරුගේ රශ්මි මණ්ඩලය ද ඒවා ප්‍රබල දඩයක්කාරයනට අන්වන ශුද්ධ වූ බලය සහ තේජස පිළිබිඹු කරනැයි ද විශ්වාස කෙරේ. මෑතක් වන තුරුම, 'හිරු මහ දෙවියන් පල්ල' කියමින් හිරුගේ දේවත්වය මත විශ්වාසය තබමින් වන්නියෙලැත්තෝ දිවුරූ හ.

මතු පරම්පරාවලට තම මුතුන් මිත්තන් ගේ බුද්ධි මහිමයේ පරම්පරාගත කතන්තර ඉදිරිපත් කරන දෘශ්‍ය උපකාරක උපකරණ සහ අධ්‍යයන මෙවලම් ලෙස මෙම ගුහා සිත්තම් දීර්ඝ කාලයක් ඔවුනට සේවය කර තිබේ. සියලු ජන කොටස්වලට ආස්වාදය ලැබිය හැකි වාම් සුලලිත අයුරින් ලංකාවේ ආදිවාසී සංස්කෘතිය ලඟා තිබුණු උසස් මට්ටමට මෙම සිත්තම් අද දක්වා නිහඬ ව සාක්ෂි දරයි.

(ගාමිණී ද එස්. ජ. පුංචිහේවා මහතාගේ 'අමතක වූ උරුමයක සිහිවටන' නම් ග්‍රන්ථය ඇසුරිනි)



හමන්ගල ගල්ගුහාවල ඇති වැදි සිත්තම්

